
# පොත් කන මීයෝ



දසිස් සන්සුක මලලසේකර

# පොත් කන මීයෝ

දසිස් සන්සුක මලලසේකර

ISBN - 978-624-208-091-8

කෘතිය පළ කරණ දිනය -2023-12-12

# පිදුම

ආදරණීය

අම්මාට, තාත්තාට...

නාට්‍ය තුළින්

ජීවිතය කියාදෙන

අමිතා රබ්බිඩිගල ගුරුතුමියට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම පඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛණකරනය සහජයෙන් උරුම කරගත් මහාමයා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථ කරනයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනයක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශයතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටත් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතතක් " ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක, ලේඛකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන් ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කල විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන්අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# හැඳින්වීම

පොත් කියවන්න මම හරිම ආසයි..

විවිධ පොත් කියවන අතරේ..

මගේ හිතට ආව පුංචි ලස්සන සිතිවිල්ලක්...

"පොත් කන මීයෝ"

ලෙස ඔබට  ඉදිරිපත් කරමි...



දසිස් සන්සුක මලලසේකර

# ස්තූතිය

මෙලෙස පොතක් නිර්මාණය කිරීමට

මා උනන්දු කරවූ

මාගේ දයාබර තාත්තාට

මෙම පොත නිර්මාණයේදී

මා හට උපදෙස් ලබා දුන්


දයාබර අම්මාට.....

ඔන්න මේක පුංචි මී පැටවු දෙන්නෙක් ගෙ කතාවක්. ඒ වගේම පුංචි අපිට හිතන්න ලබාදෙන කතාවක්.

මෙයාලා ඉන්නේ මහනුවර. එක්කෙනෙක් කොස් ඇට මීයා. අනිත් මීයා තමයි කජු ඇට මීයා. මෙන්න මේ මීයෝ දෙන්නට බඩගිනි හැදිලා නුවර ඉදන් අනුරාධපුරේට ගියාම වෙන අකරතැබ්බයක් ගැන තමා මේ කතාවෙන් කියවෙන්නේ.

අයියෝ...දුවන්න...දුවන්න...ඔන්න ඔයාගේ පිටි පස්සේ, කජ්ජෝ බලාගෙන, කජු ඇටයා අල්ලන්න කුරුමානම් අල්ලන පූසාව දැක්ක කොස් ඇටයා මහ හයියෙන් කෑ ගැහුවා.

දෙන්නම පණ බේරගෙන නැවතුණේ ගෙදර පොත් රාක්කේ අස්සේ.



"අම්මේ...අනූනවයෙන් බේරුණෝ තව පොඩ්ඩෙන් පූසට අහු වෙනවනේ... කොස් ඇටයෝ, මේ දවස් ටිකේ නුවර ඉන්න එක හරියන වැඩක් නෙවෙයි. "

කජු ඇටයා කොස් ඇටයට කිවුවෙ හයියෙන් හුස්ම ගන්න ගමන් .

"ඒ ඇයි?"

"ඒ ඇයි කියන්නේ කොස් ඇටයෝ..මේ නුවර කිසිම තැනක කිසිම විදිහකට පොත් කන්න හම්බ වෙන්නේ නෑ... පුස්තකාල වල පොත් තියෙන හැම තැනකම මිනිස්සු. පිරිලා, හැම වෙලාවෙම පොත් කියවනවා, අපිව දැක්කම එයාලා අපිට ගහනවා."

"පොත් කන්න බෑ... අපිට වෙන්නේ බඩගින්නේ මැරෙන්න තමයි."




" ඒක නම් ඇත්ත, දැනුත් මට හරිම බඩගිනී කජ්ජෝ. අපි අර එහා පැත්තෙ ගෙදරට ගිහින් බලමු කන්න මොනාහරි හොයා ගන්න. යමු...යමු... "

දෙන්නම හිමින් හිමින් අල්ලපු ගෙදර ඔෆිස් කාමරේ අස්සට රිංග ගත්තා.

"කජ්ජෝ මට පොතක් හම්බවුණා. අපි ඒක කමු" හරිම රහයි , බඩ පිරෙන්න දෙන්නම පොතේ කෑලි කෑවා. කාලා යන්න හැරුණා විතරයි කජු ඇටයා මහා හයියෙන් කෑගැහුවා...

"බලාගෙන කොස් ඇටයෝ මී කතුරක්, අයියෝ මිනිස්සුත් එනවා. පැනගමු"



එදා දවසේ පණ බේරගත්ත කජු ඇටයයි,කොස් ඇටයයි, ඊළඟ දවසේ බඩගිනි වෙලා ආයෙමත් එළියට ආවා.


" ආ... මේ ...අපි අර ගෙදරට යමුද?"

" බෑ කජ්ජෝ...ඒ ගෙදර ළමයි ඉන්නවා. අපිට ගහයි දන්නවනේ ළමයින්ගේ හැටි,

"ඒකත් ඇත්ත තමයි. මේ දවස් වල අපිට හරියට කෑමක් නෑ... මට නම් හරිම බඩගිනියි. මොනවා කරන්නද? කජ්ජෝ...මේ කාලේ පොත් විසි කරන අය නෑ... එයාලා පොත් වලට හරිම ආදරෙයි... ඒකයි මේ".

"ඒක නම් ඇත්ත තමයි කොස් ඇටයෝ. මේ දවස් වල මෙහේ පොත් කියවන අය ගොඩයිනේ. පොත් ආරක්ෂා කරන්න තමා ඒ ගොල්ලෝ මේ තරම් මී කතුරු තියලා තියෙන්නේ.. අනේ මන්දා මොනවා කරන්නද? කියලා...".

" කජ්ජෝ. අර මගේ යාළු පූසා මතකද? අපි එයා හම්බවෙලා අහමුද ? අපිට හොඳට කන්න පුළුවන් තැනක්."



“ පිස්සුද? පූසෙක් හම්බවෙන්න, අපිට කන්න කෙසේ වෙතත්, උඟ අපිව නම් කයි.”

“ අයියෝ  නෑ... නෑ.... ඒ පූසා මීයෝ අල්ලන පූසෙක් නෙවෙයි. උසස් ගණයේ පූසෙක් ”

“ ආ..කජ්ජෝ නැගිටින්න... නැගිටින්න...අද පූසා හම්බවෙන්න යන්න ඕනි” කොස් ඇට මීයා කීවා... “ ආ...ආ.... මොන පූසද?... පූසෝ අපේ හතුරෝ....”

“ මේ.. මේ.. කජ්ජෝ හීනෙන් කියවන්න එපා. නැගිටිනවා.... නැගිටිනවා...”

නැගිටලා දෙන්නම පූසව හොයාගන ගියා. කජ්ජා නම් ගියේ කොයි වෙලාවෙ මැරෙන්න වෙයිද කියන බයෙන්.

“ මේ කොස් ඇටයෝ, අරය ද අර ඔයා කිවුව පූසා ?”

“ඔව් කජ්ජෝ යමු අපි, මට නම් පුදුම බයක් , උඟ අපිව කයිද ? බලන්නකෝ උගේ ලොකු..

අනේ  මෝඩයෝ පූසෝ කොහොමත් ලොකුයිනේ අද ද පූසෙක් දැක්කේ...? ”





"මේ...කජ්ජෝ"

" ඇයි කොස් ඇට මීයෝ  අරයද අර කිවුව පූසා..?"

" ඔව් ඇයි ?"

"නෑ...නෑ එයා හරි ලොකුයිනේ."

" මේ මෝඩයෝ පූසෝ කොහොමත් මීයොන්ට වඩා

ලොකුයිනේ."

" මේ දවස්වල මී කතුරු තියන නිසා මිනිස්සු පූසෝ හදන්නෙ නෑනේ, ඒකයි ළඟදි පූසෙක් දැක්කේ නැත්තේ."

කජු ඇට මීයා බය නැති කරගන්නත් එක්කම කියවගෙන කියවගෙන ගියා.

" අනේ ඔව් කජු  ඇටයෝ. දැන් මිනිස්සු හුරතලේට හදන්නේ පූසෝ නෙවෙයි. මී කතුරුද කොහෙදෝ..."

" හා... හා.... දැන් අරයට කතා කරමු. "

දෙදෙනාම පූසාට කිට්ටු වුණා

" ඒයි..ඒයි....බුල්ඩෝසර්"

ඇයි කජ්ජෝ මොකක් ප්‍රශ්නේ ?

කජ්ජා දැකපු බුල්ඩෝසර් පූසා, කජ්ජාගෙන් ඇසුවා......

"මේ අපිට නුවර ඉන්න එක එපාවෙලා තියෙන්නේ."

" ඒ ඇයි? " "නුවර ඉන්න මිනිස්සු නිතරම පොත් කියවනවා, එයාලා ඒ පොත් වල අගය හොඳට දන්නවා... ඒ නිසා පොත් පරිස්සම් කරනවා... ඉතින් අපිට කන්නවත් පොතක් නෑ.... ඒ නිසා අපි දෙන්නම බඩගින්නේ ඉන්නේ.... නේද කොස් ඇටයෝ "

"ඔව් දැන් බඩ පිටට ඇලිලා,"

කොස් ඇටයාගේ බය නැතිවෙලා කොස් ඇටයා කියවාගෙන, කියවාගෙන ගියා. " හරි මම අදහසක් දෙන්නම් " බුල්ඩෝසර් කිවුවා...

" මොකක්ද...? මොකක්ද.....? " මීයෝ දෙන්නටම ඉවසුම් නැති වෙලා කෑ ගැහුවා.. මම ඉස්සර හිටියේ අනුරාධපුරේ. එහේ මිනිස්සු නම් වැඩිය පොත් කියවන්නේ නෑ... පුස්තකාලවලත් වැඩිය මිනිස්සු නෑ.... ඒ නිසා හොදම දේ අනුරාධපුරේ පැත්තට යන එක..

"කජ්ජෝ මොකද කියන්නේ..යමුද අනුරාධපුරේ පැත්තට? "

"හරි.ඒක නම් හොද අදහසක් තමයි. අපි එහෙනම් අද ම ලෑස්ති වෙන්න ඕනේ. යමු...යමු...උදව්වට ස්තූතියි... බුල්ඩෝසර් "


"ඒක නෙවෙයි බුල්ඩෝසර් අපිට යන විදියක් පොඩ්ඩක් කියන්නකෝ ? "

කොස් ඇටයා බුල්ඩෝසර්ගෙන් ඇහුවා...

" අම්මෝ, කොස් ඇටයෝ...මේ ටවුමේ තියෙන දුම් සැර"

" එහෙම තමයි. එතකොට අනුරධපුරේ කොහොම ඇතිද?"

"අනේ මන්දා කජ්ජෝ..... එනවා මෙහෙට, මෙහේ එළවළු ලොරියක් තියෙනවා... අපි ඒකට නගිමු. "



" අම්මෝ.... කොස් ඇටයෝ .... ගඳ, මේක නම් ෂුවර් එකට ම කුණු එළවළු ලොරියක්...කජ්ජෝ බලාගෙන,වාහන එයි. මේ....අපි අර ගහ යටට යමුද? "

" හා.... ගිහින් විවේක ගමු."
දෙන්න ම ගහක් යටට වෙලා ටිකක් විවේක ගත්තා.

" මේ අපි දැන් කොහෙටද යන්නේ කොස් ඇටයෝ..?"

"මේ... කජ්ජෝ මට අදහසක් තියෙනවා..."

" මොකක්ද? "

"අපි කොහෙන් හරි පුස්තකාලයක් හොයාගෙන ඒකට යමු."

"අප්පෝ...කොස් ඇටයෝ මෙහේ පුස්තකාලෙත් එහේ පුස්තකාල වගේ වෙයිද?"

" නෑ.... නෑ.... මෙහේ ඒවා හොඳයි."

"හා...හා... එහෙනම් ගිහින් ම බලමුකෝ..."




බුල්ඩෝසර් කිවුව විදියට දෙන්නම මාර්කට් එක පැත්තට ගිහින් අනුරාධපුරේ පැත්තට යන එළවළු ලොරියකට නැග ගත්තා.....

" නැග්ගා නම් තමයි කජ්ජෝ... ඒ වුනාට මේ ලොරිය කොහාටද යන්නේ ?"

" අනුරාධපුරයට...."
"කොහොමද දන්නේ ?"

" ඇයි කොස් ඇටයෝ මේකේ ගහලා තිබුණේ, රජ රටට එළවළු කියලා ...."

දෙන්නම එළවළු ලොරියෙන් අනුරාධපුරේට ආවා.



" අයියෝ... ! කජ්ජෝ...මෙහේ පුස්තකාලයක් නෑනේ... පූසා කිවුවා හරි, මෙහේ පොත් කියවන මිනිස්සු විතරක් නෙවෙයි, පොතුත් නැද්ද කොහෙදෝ...? "

"ආ... මේ... කජ්ජෝ.... පිටිපස්ස බලන්නකෝ."

" ඇයි මොකද? "

"ඈ...මේක පුස්තකාලයක් ද ...? නැත්තම් බංගලාවක් ද..?

" පුස්තකාලයක් කජ්ජෝ..."

"මොකක් හරි,කොස් ඇටයෝ, අපි ඒකට ගිහින් ම බලමු."

" මේ... කජ්ජෝ, මේක පුස්තකාලයක් වුණාට මෙහේ කිසිම මනුස්සයෙක් නෑනේ... පොත් වල මකුළුදැල් පිරිලා....."



" ඒක තමයි, මාත් බැලුවේ...කමක් නෑ කොස් ඇටයෝ මිනිස්සු නැති තරමට අපිට හොඳයි."

" ඒ කියන්නේ මිනිස්සුත් නෑ.... මී කතුරුත් නෑ..... මං හරිනේ. "

"හරි...හරි....දැන් කතාව ඇති.."

"ඔව්... ඔව් දැන් තියෙන්නේ... පොත් කන්න."
"හරි, එහෙනම්.දැන් තියෙන්නේ කොස් ඇටයට යි කජු ඇටයට යි පොත් භුක්ති විඳින්න. එහෙනම් භුක්ති විදිමු. අම්මේ.... කොස් ඇටයෝ...."

"කජ්ජෝ.... මෙහේ පොත් හරි රහයිනේ..."
" ඒක තමයි, මම දැනට ම විසිහතරක් කාලා ඉවරයි."
"මමත් ඒ වගේම පොත් ප්‍රමාණයක් කෑවා...."




“ අම්මේ.... කජ්ජෝ....මට නම් උස්මුරුත්තාව වගේ.”

“ඒක තමයි කොස් ඇටයෝ... මටත් ඒ වගේ දැනෙනවා... මට නම් හිතෙන්නේ අපි පොත් කෑවා වැඩියි වගේ....”

“ ඒකත් හරි කියමුකෝ... අපි නවතින්නේ කොහේ ද? ”

“මට නම් කොස් ඇටයෝ, හෙල්ලෙන්නවත් බෑ...අපි මෙතන ම නිදාගෙන මෙතන ම ඉමු. මොකද ඉතින් මෙතන අපිට කරදර කරන්න මිනිස්සු ඉන්නවා කියලා යෑ....”




" මේ.....කොස් ඇටයෝ....නැගිටිනවා...."
" ඇයි...අනේ... වද දෙන්නේ ...? "

" මොන වදයක්වත් දෙන්නේ නෑ........ අදත් කිසිම කෙනෙක් එන්නෙ නෑ වාගේ....ඒ නිසා..... අදත් හොදට පොත් කමු නේද....? "

" අයියෝ.... මේ.... කජ්ජෝ....මට නම් දැන් පොත් කන්න බෑ.... තවම බඩ අඩු වෙලා නෑ....මට දැන් තමයි තේරෙන්නේ මිනිස්සු පොත් කොච්චර අතෑරියත්, ඒවා කන්න අපේ බඩේ ඉඩ නෑ කියලා.... "

" අනේ ඔව් , එහෙනම් අපි දෙන්නා තවත් හොඳට නිදාගමු... කජ්ජෝ.....මෙහෙ මිනිස්සුන්ට කියන්න ඕනේ ඉඳලා හිටලාවත් පොත් කියවන්න කියලා..... නැත්තම් අපිටවෙන්නේ උස්මුරුත්තාව හැදිලා මැරෙන්න...."

"දැක්කා නේද යාලුවණේ පොත් කියවන්නේ නැති තැන්වල මීයෝ පිණුම් ගහනවා කිය



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසර් දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟා වීමට නූතන තාක්ෂනය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමණයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසැල් මට්ටමින් ආරම්භ කර ජාතිකතලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

" දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරනයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01